ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 1.10 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 15 වන දින]

එල්.ඩී.—ඕ. 100/80.

**මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව සඳහන් කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය. තව ද එහි සංස්ථා නාමයෙන් අධිකාරිය විසින් හා අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

3. (1) අධිකාරිය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:— අධිකාරියේ සාමාජිකයන්.

(අ) සිවිල් ඉංජිනේරු විද්‍යාව, මහාමාර්ග ඉංජිනේරු විද්‍යාව, වාණිජ්‍යය, මූල්‍ය කරුණු හෝ පරිපාලනය පිළිබඳ පුළුල් පළ පුරුද්දක් සහ නිපුණත්වයක් දක්වා ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් පස් දෙනෙක්; සහ

(ආ) (i) මහා මාර්ග පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ii) මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(iii) විදුලි බලය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

2—ඒ 59526—15,500 (81/11)

(iv) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ; සහ

(v) මහා මාර්ග අධ්‍යක්ෂවරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා

විය යුතු වෙනත් සාමාජිකයන් පස් දෙනෙක්.

(2) අධිකාරියේ පත් කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන හෝ එසේ මන්ත්‍රීවරයකු බවට පත්වන තැනැත්තකු අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට සුදුස්සකු නොවිය යුතු ය.

(4) යම් තැනැත්තකු අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙර, අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා විසින් තම කර්තව්‍ය ඉටු කිරීමේ දී හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති කිසිදු මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය. තව ද, අධිකාරියේ කිසිම සාමාජිකයකුට එවැනි යම් සම්බන්ධතාවක් නොමැති බවට අමාත්‍ය වරයා කලින් කල සෑහීමට පත් විය යුතු ය. මේ උපවගන්තිය යටතේ තම කාර්ය තමා විසින් ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ විටක, අධිකාරියේ සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් තැනැත්තකු විසින් හෝ අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට අමාත්‍යවරයා යෝජනා කරන යම් තැනැත්තකු විසින් හෝ ඒ තොරතුරු අමාත්‍ය වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(5) අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව, කෙළින් ම හෝ අන් අයුරකින්, කිසියම් සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින් තම සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමක දී එළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ එළිදරව් කිරීම අධිකාරියේ වාර්තාවල සටහන් කරනු ලැබිය යුතු ය. තව ද ඒ ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන යම් විචාරණයක දී හෝ තීරණයකට එළඹීමේ දී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

(6) අධිකාරියේ සෑම පත් කළ සාමාජිකයකු ම, (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට ගණන් ගැනෙන හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා සිය ධුරය දැරිය යුතු අතර, (8) වන උපවගන්තිය යටතේ ඔහු ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය :

එසේ වුව ද අධිකාරියේ පත් කළ සාමාජිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීමට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයකු කලින් සිය ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(7) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය අධිකාරියේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව විය යුතු ය.

(8) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් පත් කළ සාමාජිකයකු කිසියම් හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අධිකාරියේ සාමාජිකයකු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියමයක් කරනු ලැබ ඇති විටක දී ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ දී ඒ සාමාජිකයා සිය ධුරය හිස් කළ යුතු ය.

(10) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් ඕනෑම අවස්ථාවක අධිකාරියේ පත් කළ සාමාජිකයකුට සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපතිවරයා වශයෙන් වූ හෝ ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(11) අධිකාරියේ යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක,—

(අ) ඔහු පත් කළ සාමාජිකයෙක් නම්, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට, (1) (අ) උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය ; නැතහොත්

(ආ) ඔහු (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) සිට (iii) දක්වා වූ අනුරු ඡේදයන් යටතේ නම් කරනු ලැබූ සාමාජිකයෙක් නම්, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට, ඒ සාමාජිකයා නම් කළ අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(12) අධිකාරියේ සභාපතිවරයා රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් යම් පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(13) අධිකාරියේ සියලු ම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවකුට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික, දීමනා හා වෙනත් වියදම් අධිකාරියේ මුදල්වලින් ගෙවනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය පටිපාටිය.

4. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින අධිකාරියේ සෑම රැස්වීමක ම මූලාසනය ඔහු විසින් දැරිය යුතු ය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතු ය.

(2) අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර වූ හෝ අවස්ථාවක එය රැස්විය යුතු ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(5) අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබිය දී වුව ද අධිකාරියට ක්‍රියා කළ හැකි ය. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගුවීම හෝ අවලංගු වූ සේ සලකනු ලැබීම නොසිදු විය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

අධිකාරියේ මුද්‍රාව.

5. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) එක් අයකු අධිකාරියේ සභාපතිවරයා වන්නා වූ අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබනු නොලැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

කමිටු පිහිටුවීම සඳහා අධිකාරියේ බලය.

6. (1) අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය නියම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා යම් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත කමිටු අධිකාරිය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින්, එහි බලතල, කර්තව්‍ය හා කාර්ය අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි ඒ කමිටුවලට පැවරිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන සෑම කමිටුවක් විසින්, ඒ කමිටුවේ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය තීරණය කරනු ලැබිය යුතු ය.

මාර්ග සංවර්ධන උපදේශක මණ්ඩලය.

7. (1) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග සංවර්ධන උපදේශක මණ්ඩලයක් පිහිටුවිය යුතු ය:—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වන මහාමාර්ග පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(ආ) විදුලි බලය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඇ) විදුලි සන්දේශ පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඈ) පළාත් පාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඉ) රජයේ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඊ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(උ) සංචාරක විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඌ) මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කළ යුතු වන මෙම අධිකාරියේ සාමාන්‍යාධිකාරී ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(එ) මහාමාර්ග අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඒ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඔ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩලය පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඕ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ; සහ

(ක) මහාමාර්ග ඉංජිනේරු විද්‍යාව හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පුළුල් පළපුරුද්දක් හා නිපුණත්වයක් දක්වා ඇතැයි පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයන් තුන් දෙනකු.

මේ ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු, මින් මතු " මණ්ඩලයේ පත් කළ සාමාජිකයා " යනුවෙන් මේ වගන්තියේ සඳහන් කරනු ලැබේ.

(2) (අ) මාර්ග පර්යේෂණය, මාර්ග ක්‍රම සම්පාදනය හා මාර්ග සංවර්ධනය පිළිබඳව වූ ප්‍රතිපත්තිය හා ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා විසින් හෝ අධිකාරිය විසින් මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය හැකි අධිකාරියේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සම්බන්ධයෙන් වූ යම් කාරණයක් පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයාට හෝ අධිකාරියට උපදෙස් දීම

මණ්ඩලයේ කර්තව්‍යය විය යුතු ය.

(3) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු විසින් ම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මගින් ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවස්ථානුකූල යයි සලකනු ලබන්නේ නම්, ඔහු විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් හේතු කිසිවක් නොදක්වා එසේ කළ හැකි අතර එවැනි ඉවත් කිරීමක් පිළිබඳව කිසිදු අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතු ය.

(5) තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් පත් කළ සාමාජිකයකුට කවර වූ හෝ අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු මිය ගිය විට හෝ ඉල්ලා අස්වන විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන විට, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ක) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන මිය ගිය, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයා වෙනුවට සාමාජිකයකු වීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු විසින්, ඔහු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් සිය ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවූ ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(8) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු මාස තුනකට නොඅඩු කාලයක් සඳහා රෝගාතුරවීමේ, වෙනත් අබලතාවක හෝ ශ්‍රී ලංකාවේ නොසිටීමේ හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ බව ලියවිල්ලකින් අමාත්‍යවරයා වෙත දැනුම් දීම ඒ සාමාජිකයාගේ යුතුකම විය යුතු ය. අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (ක) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ තැනැත්තා වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(9) ඉවත් කරනු ලැබීමෙන් හැර ධුරය අත්හැර යන මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(10) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් හෝ මණ්ඩලයේ සාමාජික සකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබූ පමණින් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

(11) යටත් පිරිසෙයින් සෑම දෙමසකට වරක් මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විය යුතු ය.

(12) සභාපතිවරයා විසින් හෝ ඔහු නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින්, මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය.

(13) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්දවල සමානතාවයක් ඇති වූ අවස්ථාවක, මූලසුන දරන සාමාජිකයා වෙත තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(14) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු අතර, මණ්ඩලය විසින් මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ ම කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(15) මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට හා අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

## II වන කොටස

### මාර්ග සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය

8. (1) ප්‍රාදේශික හා ජාතික ක්‍රම සම්පාදනයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන, යම් ප්‍රදේශයක මාර්ග සංවර්ධනය විධිමත් කිරීම හා පාලනය කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඒ ප්‍රදේශය (මෙහි මින් මතු "සංවර්ධන ප්‍රදේශයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග සංවර්ධන ප්‍රදේශයක් විය යුතු බවට ඔහු විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

අමාත්‍යවරයාගේ නියමයක් මගින් මාර්ග සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා ඒ නියමවල බලපෑම.

(2) සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කෙරෙන (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් ඒ ප්‍රදේශයේ සීමා හා මායිම් සලකුණු කොට ඒ ප්‍රදේශය වෙන් කර දැක්විය යුතු ය.

(3) සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබීම මත, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව හැර, ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක් මගින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කිසිදු මාර්ග සංවර්ධන වැඩක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරනු ලැබීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

9. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත—

(අ) අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයක්ට යටත්ව, ඒ ප්‍රදේශ ඇතුළත අනුකලනය කළ මාර්ග ක්‍රම සම්පාදනය හා මාර්ග සංවර්ධනය කරගෙන යාම;

(ආ) අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව, ඒ ප්‍රදේශවල අනුකලනය කළ මාර්ග ක්‍රම සම්පාදනය හා අනුකූල වූ ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධන වැඩ, ක්‍රියාකාරකම් හා සේවාවන් පිළිබඳ සම්බන්ධිත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම;

(ඇ) මූලධන ආයෝජන සැලසුම් ඇතුළුව මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම හා ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබීම සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ඈ) ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම භාර ගැනීම;

(ඉ) ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන යම් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට, කෙළින් ම හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් තැනැත්තකු සමග හවුල් ව්‍යාපාරයක ස්වරූපයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හා කරගෙන යාම;

(ඊ) යම් අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් නිම කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු විසින් පැහැර හරින ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය නිම කිරීමට භාර ගැනීම;

(උ) ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබූ මාර්ග සංවර්ධන සැලසුම් හා මූලධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම;

(ඌ) ඒ ප්‍රදේශවල ප්‍රධාන මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් සම්පාදනය කිරීම;

(එ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හෝ දැරීම නැතහොත් එය විසින් අත්කර ගනු ලැබූ හෝ දරූ යම් චංචල හෝ නිශ්චල දේපළක් බැහැර කිරීම;

(ඒ) ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක ඉල්ලීම අනුව, ඒ නියෝජිතායතනය වෙනුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රම සම්පාදන යෝජනා ක්‍රම පිළියෙළ කිරීම් සහ ඒ ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම හෝ ඊට සහාය වීම;

(ඔ) ඒ ප්‍රදේශවල ආණ්ඩුවේ නියෝජිතායතනවල හෝ වෙනත් තැනැත්තන්ගේ යහපත සඳහා මාර්ග ක්‍රම සම්පාදන සේවා සැපයීම;

(ඞ) අධිකාරිය විසින් සපයනු ලබන කවර වූ හෝ සේවාවන් සඳහා ගාස්තු අය කිරීම ;

(ක) මුදලින් හෝ අන්‍යාකාරයෙන් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් භාර ගැනීම සහ අධිකාරියේ අරමුණු අතුරෙන් යම් අරමුණක් කරගෙන යෑම සඳහා ඒවා උපයෝගී කිරීම ; සහ

(ග) මේ පනත යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් ප්‍රාසංගික හෝ ආනුෂංගික වන්නා වූ සියලු ක්‍රියා හෝ දේවල් කිරීම

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් යම් සංවර්ධිත ප්‍රදේශයක් ඇතුළත මාර්ග ක්‍රම සම්පාදනය සහ මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් වූ යම් වැඩ සටහනක් හෝ සංවර්ධන වැඩක් ක්‍රියාත්මක කරන විට, අවස්ථාවෝචිත පරිදි, කවර වූ හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විමසා ඒ වැඩ සටහන හෝ සංවර්ධන වැඩය ක්‍රියාත්මක කිරීම අධිකාරියේ කාර්යය වන්නේ ය.

10. (1) අධිකාරිය විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය. අමාත්‍යවරයාගේ විධාන.

(2) අධිකාරියේ දේපළ සහ කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කල ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, අධිකාරිය විසින් එවැනි සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

11. මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් අධිකාරිය විසින් අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් නිලධරයකුට ලියවිල්ලකින් පැවරිය හැකි ය. අධිකාරිය විසින් බලතල ආදිය පැවරීම.

## III වන කොටස

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

12. (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයකු පත් කරනු ලැබිය යුතු ය. අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා.

(2) අධිකාරියේ වැඩ කටයුතු මෙහෙයවීම ද අධිකාරිය සංවිධානය කිරීම සහ එහි බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම ද අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය ද ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අධිකාරියේ සාමාන්‍ය විධාන යට යටත්ව, සාමාන්‍යාධිකාරිවරයාට භාර කරනු ලැබිය යුතු ය.

(3) තමාගේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය, අධිකාරියේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, සාමාන්‍යාධිකාරිවරයා විසින් ලියවිල්ලකින්, ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතු ය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සාමාන්‍යාධිකාරිවරයා ධුරයෙන් ඉවත් නොකරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත් වීම් ආදිය.

13. (1) අධිකාරිය විසින්, මේ පනතේ වෙනත් විධිවිධානයන්ට යටත්ව—

(අ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කාර්ය මණ්ඩලයක් පත් කිරීම, විසුරුවා හැරීම සහ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යාම ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි තීරණය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථ සාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු ම කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් වූ රීති අධිකාරිය විසින් සාදනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ ද එම නිලධරයා සේවා නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන

වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින්, ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා මණ්ඩලයට සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීම සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතු ය.

(7) අධිකාරියේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ එම පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනි ම කැමැත්ත ඇතිව තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. එසේ නැතහොත් විශ්‍රාම වැටුප් හිමිකම් හෝ අර්ථ සාධක අරමුදල් හිමිකම් හෝ පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ එම පළාත් පාලන ආයතනය හෝ අතර ගිවිස ගනු ලබන නියම සහ කොන්දේසි මත එම සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තියේ විධිවිධාන අනුව යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් වන්නේ ය.

## IV වන කොටස

### මුදල්

14. (1) අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදල

(2) අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතු ය:—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) කවර වූ හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ඈ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්.

(3) මේ පනත සහ වෙනත් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, අධිකාරියේ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම, අධිකාරියේ සාමාජිකයන් වෙත හා අධිකාරියේ සේවා නියුක්තයන් වෙත පාරිශ්‍රමිකයන් ගෙවීම, අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් දරනු ලබන යම් වියදම් ගෙවීමේ කාර්යය සඳහා සහ කලින් කල අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්ය සඳහා අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් උපයෝගී කර ගත හැකි ය.

(4) අධිකාරියේ ආරම්භක මූලධනය රුපියල් දශ ලක්ෂයක් විය යුතු ය. ආරම්භක මූලධනයේ මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා තීරණය කරන වාරික වලින් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු අතර ඒ මුදල් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට බැර කළ යුතු ය.

අධිකාරියේ ණය ගැනීමේ බලතල.

**15.** මේ පනත යටතේ අධිකාරියේ කාර්ය ඉටු කිරීමේ දී සිය වගකීම් ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ අමාත්‍යවරයා විසින් දෙන ලද පොදු අධිකාරයක නියමයන්ට අනුකූලව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකි ය :

එසේ වුවද, අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් තාවකාලික ණය මුදල් වෙනුවෙන් ඉතිරිව ඇති මුළු මුදල, කිසිම අවස්ථාවක දී, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරන මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

**16.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරියේ ආදායම හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනු දෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නාවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

### මුදල්

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**17.** අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව හා කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය අල් ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

18. අධිකාරිය අල් ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතෙහි විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට පවරනු ලබන නඩු සඳහා ආරක්ෂාව.

19. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකි ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ගෙවනු ලැබූ හෝ අය කර ගනු ලැබූ යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(3) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් යුක්තව කරන ලද්දේ යයි අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ වියදම, එම සිවිල් හෝ අපරාධ නඩුව සම්බන්ධයෙන් ඔහු විසින් අයකර ගෙන ඇති නම් විනා, අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු ය.

අධිකාරියේ තැනැත්තකුට හෝ සාමාජිකයකුගේ දේපළට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

20. අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී අධිකාරියේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

රීති සෑදීමට අධිකාරියට ඇති බලය.

21. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සහ මේ පනතින් රීති සාදනු ලැබීමට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සෑදිය හැකි ය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදන ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

22. (1) අධිකාරියේ වැඩ කටයුතු පිළිබඳ කාර්යය සඳහා යම් දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති සහ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම යෝජිත අත්කර ගැනීම අනුමත කරන අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

චංචල හා නිශ්චල යන රජයේ උභය දේපළ ම අධිකාරිය වෙත ලබා දිය යුතු බව.

23. (1) අධිකාරියේ යම් වැඩ කටයුත්තක කාර්යය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, එම කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීමක් හෝ බදු දීමක් කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, අධිකාරිය වෙත ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදු දීම සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) අධිකාරියේ කාර්යය සඳහා අමාත්‍යවරයාගේ පාලනය යටතේ වූ රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් ඒ චංචල දේපළෙහි සන්තකය හා භාවිතය අධිකාරිය වෙත පවරා සතු කර දිය හැකි ය.

යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීම සඳහා බලය.

24. අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්, යම් ඉඩමක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත යටත් පිරිසෙයින් ලියවිල්ලකින් වූ දින තුනක දැනුම් දීමක් කිරීමෙන් පසුව, ඒ ඉඩමට හෝ ස්ථානයට ඇතුළුවීම සහ එහි දී අධිකාරියේ යම් වැඩක් කරගෙන යාමේ හෝ අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ යම් කර්තව්‍යයක් ඉටු කිරීමට මූලික වූ හෝ ආනුෂංගික වූ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි ක්‍රියාවක් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

වැරදි හා දණ්ඩන.

25. මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, නියමයක්, විධානයක් හෝ නියම කිරීමක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ කල්හි, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"ආණ්ඩුවේ නියෝජිතායතනය" යන්නෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් අදහස් වේ;

"මාර්ග වැඩි දියුණු කිරීම්" යන්නට යම් මාර්ගයක් පුළුල් කිරීම, මාර්ග මට්ටම් කිරීම, පදිකයන්ගේ ප්‍රයෝජනය පිණිස පදික වේදිකා සැපයීම, දූවිලිවලින් වන හිරිහැරය අඩු කිරීම සඳහා මාර්ගයකට ප්‍රතිකර්ම යෙදීම, මාර්ගවල ගස් රෝපණය කිරීම හා තණ කොළ තීරු ඇතිරීම සහ යම් පවත්නා මාර්ග අලුත් වැඩියා කිරීමේ නියම තත්ත්වයෙන් නැඹීම සඳහා අවශ්‍ය සාමාන්‍ය අලුත්වැඩියාවන් ඉක්ම වූ මාර්ග සම්බන්ධයෙන් වූ වෙනත් යම් වැඩ කිරීම ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් සංවර්ධන මණ්ඩලයක්, මහ නගර සභාවක්; නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන හා කරන බලතලවලට, කාර්යයන්ට හා කර්තව්‍යයන්ට අනුරූප වන හෝ සමාන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මූළු අරමුදල හෝ මූළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"මාර්ගය" යන්නෙහි මහා මාර්ග ආඥාපනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"මාර්ග සංවර්ධනය" යන්නෙන් අලුත් මාර්ග ඉදි කිරීම හෝ පවත්නා මාර්ග නඩත්තු කිරීම හෝ වැඩි දියුණු කිරීම් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය